Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

**2013 Public Examination**

# Sinhala

## Continuers Level

**Wednesday 16 October: 2 pm Australian Eastern Daylight Time**

Reading Time: 10 minutes
Working Time: 2 hours and 30 minutes

- *You have 10 minutes to read all the papers and to familiarise yourself with the requirements of the questions. You must not write during this time.*
- *Monolingual and/or bilingual printed dictionaries may be consulted during the reading time and also during the examination.*

## Section 1: Listening and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 40 minutes for Section 1.
2. Write all your answers to the questions in Section 1 in this booklet in black or blue pen. Space is provided for you to make notes.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*© Victorian Curriculum and Assessment Authority 2013*

**Part A** (Questions 1–3)
(15 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

---

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings. You may make notes at any time.

Listen carefully to each text and then answer the questions in ENGLISH.

**Marks** | You may make notes in this space.

**Text 1**

1. (a) What are the **two** main pieces of information in this news item? **2**

______________________________

______________________________

(b) Identify **two** reasons why the result was so positive. **2**

______________________________

______________________________

______________________________

______________________________

Marks | You may make notes in this space.

**Text 2**

2. (a) What statistical evidence in the UN report shows that there is a low rate of urbanisation in Sri Lanka? **1**

(b) According to the Minister, why is urbanisation **not** essential in Sri Lanka? **4**

Marks

You may make notes in this space.

**Text 3**

3. According to the speaker, the lives of women in Sri Lanka have changed over time. Identify **three** different changes that have occurred and give **one** reason why each change has taken place. **6**

| The change that has taken place | The reason for the change |
|---|---|
| • | • |
| • | • |
| • | • |

## **Part B** (Questions 4–6)
(15 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of texts by identifying and analysing information;*
- *convey the information accurately and appropriately.*

---

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings. You may make notes at any time.

Listen carefully to each text and then answer the questions in SINHALA.

**Marks** | You may make notes in this space.

**Text 4**

4. ‘Sri Lanka is advancing technologically.’ Provide **two** pieces of evidence from the news item that support this statement. **2**

   ‘ශ්‍රී ලංකාව තාක්ෂණයෙන් දියුණු වෙමින් පවතී.’ මෙම වගන්තිය සනාථ කිරීමට කරුණු ප්‍රවෘත්තිය ඇසුරෙන් සපයන්න.

_______________________________________________

_______________________________________________

_______________________________________________

_______________________________________________

**Marks** | You may make notes in this space.

**Text 5**

5. According to the archaeologists, what may the place discovered in the excavations have been used for originally? Give **three** pieces of evidence that the archaeologists used to reach this conclusion. **4**

   පුරා විද්‍යාඥයන්ට අනුව කැණීම් වලින් සොයා ගත් ස්ථානය මුලින් භාවිතා වුයේ කුමක් සඳහා විය හැකි ද? එම නිගමනයට එළඹීම සඳහා පුරා විද්‍යාඥයන් උපයෝගී කරගත් සාක්ෂි තුනක් දක්වන්න.

   තීරණය- ______________________________

   ______________________________

   හේතු-

   - ______________________________

     ______________________________
   - ______________________________

     ______________________________
   - ______________________________

     ______________________________

Marks | You may make notes in this space.

**Text 6**

6. (a) What is the main topic of this conversation? Explain Seetha's regrets about her decision. **3**

මෙම සංවාදයේ මාතෘකාව කුමක් ද? සීතාට ඇයගේ තීරණය පිළිබඳව පවතින පසුතැවිල්ල විස්තර කරන්න.

(b) Give **three** reasons why Seetha made her decision. **3**

සීතාට, ඇය විසින් ගත් තීරණයට හේතුවූ කරුණු තුනක් දක්වන්න.

(c) Give **three** pieces of evidence to support Sarath's statement that Seetha's parents are like 'fish out of water'. **3**

'සීතාගේ දෙමවුපියන් දියෙන් ගොඩ දැමූ මාලු වගේ' යැයි සරත් සඳහන් කළ ප්‍රකාශය තහවුරු කිරීමට සාධක තුනක් දක්වන්න.

**End of Section 1**

Student/Registration Number | | | | | | | | | | |   Centre Number | | | | | | |

# 2013 PUBLIC EXAMINATION

# Sinhala
## Continuers Level

## Section 2: Reading and Responding (25 marks)

**Instructions to Students**

1. Allow approximately 1 hour and 10 minutes for Section 2.
2. Write all your answers to the questions in Section 2 in this booklet in black or blue pen.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*© Victorian Curriculum and Assessment Authority 2013*

**Part A** (Questions 7–8)
(10 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and/or specific aspects of texts, by, for example, comparing, contrasting, summarising, or evaluating, and convey the information accurately and appropriately.*

---

7. Read the text and then answer in ENGLISH the questions that follow.

## අපේ අනාගතයට ශක්තිය සූර්යයාගෙන්

**උදක වීරරත්න**

ඈත අතීතයේ ජීවත් වු මිනිසා තම ජීවන ක්‍රියාවලියට අවශ්‍ය ශක්තිය මූලික වශයෙන් ලබා ගත්තේ සූර්යයා ගෙන්ය. පසු කාලීනව ගල් අඟුරු, බොර තෙල් වැනි ඉන්ධන සහ වෙනත් ශක්ති ප්‍රභවයන් සොයා යෑමත් සමග සූර්ය ශක්තිය කෙරෙහි අවධානය අඩු විය.

බොහෝ රටවල විදුලි බලාගාර භාවිතා කරන්නේ ගල් අඟුරු ඉන්ධනයි. දියුණු රටවල න්‍යෂ්ඨික බලාගාර ද ඇත. දැනට ගල් අඟුරු භාවිතා වන වේගය අනුව එය තව දශක කිහිපයකට පමණක් ප්‍රමාණවත් වේයැයි ගණන් බලා ඇත.

ශ්‍රී ලංකාව, 1895 දී ගල් අඟුරු තාප බලාගාරත්, 1950 න් පසුව ජල විදුලි බලාගාරත් ආරම්භ කළේය. දැනට ලංකාවේ ජල විදුලි බලාගාර 10 කටත් වඩා ඉදිවී ඇත. එ නමුත් ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය සහ විවෘත ආර්ථිකයත් නිසා, විදුලි උපකරණ භාවිතය වැඩි විය. කම්හල් ඉදි විය. ගම්වලට පවා විදුලිය ව්‍යාප්ත කරනු ලැබීය. එ බැවින් විදුලියට තිබූ ඉල්ලුම ද වැඩි විය.

වරින් වර ඇතිවන නියඟයන් නිසා, ජල විදුලි බලාගාර මඟින් විදුලිය සැපයීම අඩපණ වේ. තාප බලාගාර වලින් පමණක් සපයන විදුලිය ද ප්‍රමාණවත් නොවේ. තවද, ගල් අඟුරු සඳහා අධික මිලක් ද වැය වේ. මේ හේතුන් නිසා, දිනකට පැය ගණනක් විදුලිය කපා හැරීම, සැණකෙළි සීමා කිරීම, ගොඩනැගිලි සහ පූජා ස්ථානවල අනවශ්‍ය ආලෝකය නිවා දැමීම සහ විදුලි ගාස්තු ඉහළ දැමීම වැනි පියවර ගැනීමට සිදු විය.

ලෝකයේ බොහෝ රටවල විදුලිය භාවිතය සීමාව ඉක්මවා ඇත. එමෙන්ම විවිධ කාලගුණ විපර්යාසයන්ට මුහුණ දීමට ද සිදුව තිබේ. එම නිසා බලශක්ති අර්බුදය ශ්‍රී ලංකාවට පමණක් නොව, ඉතා ඉක්මනින්ම මුළු ලොවටම බලපාන බව රහසක් නොවේ. සීමිත සම්පතකින් අසීමිත ප්‍රයෝජන ලබා ගැනීමට යෑමෙන් අනාගතයේ දී විශාල බලශක්ති අර්බුදයකට මුහුණ දීමට සිදුවනු ඇත.

මෙයට පිළියමක් ලෙසින් අනාගතයේ දී පුනර්ජීව බල ශක්තිය භාවිතය කෙරෙහි, අවධානය යොමුවෙමින් පවතී. එයින් වඩාත් වැදගත් තැනක් දී ඇත්තේ, නොමිලේ ලැබෙන සූර්ය බල ශක්තිය කෙරෙහිය. එ බැවින් ශ්‍රී ලංකාවේ ද ගෘහස්ථව සහ මහා පරිමාණයෙන් සූර්ය ශක්තිය මගින් විදුලිය නිපදවා ගැනීමේ තාක්‍ෂණය භාවිතා කිරීමට සැලසුම් කරගෙන යයි.

QUESTIONS

**Marks**

(a) The author of the article states that ‘unlimited use has been made of very limited resources’. Relate this statement to the context of the whole article. **2**

(b) Provide evidence from the text to show that the author’s statement above is correct. **3**

8. Read the text and then answer in ENGLISH the questions that follow.

පසන්ගේ දින පොතෙන් මතක සටහනක්

අද දවස අඬන්න ද, සතුටු වෙන්න ද, කියලා හිතා ගන්න බැහැ. අම්මාගේ මුහුණේ නම් තියෙන්නේ උතුරා යන සතුටක්. අපෙන් වෙන්ව අලුත් ජීවිතයක් පටන් ගන්න මගේ එකම අක්කා ගැන, අම්මාට දුකක් නැති එක ගැන මට පුදුමත් හිතෙනවා. 'දුවෙක් හදපු අම්මෙක්ට, මීට වඩා සතුටු වෙන්න පුළුවන් දවසක් නැහැ' කියලා අක්කාත් එක්ක කියනවාත් මට ඇහුණා.

අක්කා මට වඩා අවුරුදු දොළහක් වැඩිමල්. ඒ නිසා වෙන්න ඇති මා කෙරෙහි පුදුමාකාර ආදරයක් තියෙන්නේ. සමහර වෙලාවට මට හිතෙනවා, අක්කා මට අම්මටත් වඩා ආදරෙයි කියලා. මාව හුරතල් කරලා නරක් කරන්නේ අක්කයි කියලා බැනුම් අහන වෙලාවල් අනන්තයි. මට ඉදිරිපත් වෙන හැම නඩුවකම ජූරිය අක්කයි. ඒ හැම නඩුවක්ම විසඳුණේ මගේ වාසියට. පාසැලේ දීපු ගෙදර වැඩ ටික ඉවර කරන්න උදවු කළේත් අක්කායි. අක්කා මට නොදී කිසිම දෙයක් කන්නේ නැහැ. කොටින්ම සිරි අයියා දෙන චොකලට්වලින් වැඩි කොටසක් දෙන්නේත් මට.

අද ඉඳන් මට කාගේ හවිහරණක් ද? ඒ හින්දා වෙන්න ඇති අක්කා ඊයේ මාව තුරුල් කරගෙන කිවුවේ 'මල්ලි දඟ කරන්නෙ නැතුව ඉන්න, පාඩම් වැඩ හොඳට කරගන්න. කවදා හරි දවසක මේ සමාජයට ප්‍රයෝජනවත් මිනිහෙක් වුණාම, ඒ තමයි මගේ මල්ලී කියලා අක්කට ආඩම්බර වෙන්න පුළුවන්' කියලා. අපි දෙන්නම හුඟ වෙලාවක් තුරුළු වෙලා ඇඬුවා. 'හොඳයි අක්කේ, මම අක්කාගේ බලාපොරොත්තුව ඉෂ්ඨ කරන්න මහන්සි ගන්නවා. ඒත් අක්කා ගෙදර නැතුව මා ගෙවන ජීවිතය කොයි වගේ වෙයි ද කියලා හිතා ගන්නවත් බැහැ. අක්කා නැති පාළුවයි, පාඩුවයි දෙකම තියෙන්නේ මටනේ.'

අද අක්කාට විශේෂ දවසක් ලු. ඒක වෙන්න ඇති, අද අක්කාගේ මුහුණ රෝස මලක් වගේ ලස්සනට පිපිලා තිබුණේ. සිරි අයියා නම් හරි වාසනාවන්තයි. මගේ සුදු අක්කා සිරි අයියාගේ හැම වැඩකටම උදවු වේවි. සිරි අයියා ගැන මට ඊර්ෂ්‍යාත් හිතෙනවා. එහෙමත් හරි නැහැනේ. අක්කා සිරි අයියාට ආදරෙයි කියලා දවසක් මට කිවුවා. සිරි අයියා අක්කටත් ආදරෙයිලු. සිරි අයියා මටත් ආදරෙයිලු. පාසැල් නිවාඩුවට මට අක්කාත් එක්ක ඇවිත් ඉන්න කියලා සිරි අයියා කිවුවා. ඒ මොනවා වුණත් සිරි අයියා අක්කාව හොඳින් බලාගත්තොත් මට ඒ ඇති. මගේ අක්කා මට ඕනෑම වෙලාවක මගේ ළඟ ඉන්නවා කිවුවනේ. අක්කාගේ අලුත් ජීවිතයට මම ශුභ ප්‍රාර්ථනා කරනවා.

QUESTIONS

**Marks**

(a) What was the special day on which Pasan made this diary entry? **1**

(b) Provide evidence from Pasan's diary that shows that his sister always defended him. **2**

(c) Explain why Pasan finally decided to accept the situation. **2**

**Part B** (Question 9)
(15 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of a text by identifying, analysing, and responding to information;*
- *convey information coherently (structure, sequence, accuracy and variety of vocabulary and sentence structure) and appropriately (relevance, use of conventions of the text type).*

---

9. Read the text and then answer the question in approximately 150 words in SINHALA on page 7.

**පුවත් පත් දැන්වීමක්**

එක්සත් ජාතීන්ගේ ඊළඟ තරුණ සමුළුව ශ්‍රී ලංකාවේ

2014 වසරේ එක්සත් ජාතීන්ගේ තරුණ සමුළුව ශ්‍රී ලංකාවේ පවත්වන බව, එක්සත් ජාතීන්ගේ ලේකම් බැන් කී මූන් මහතා නිල වශයෙන් පැවසීය. මෙම සමුළුව ආසියානු රටක පවත්වන මුල් අවස්ථාව මෙය වේ. මේ අවස්ථාවෙන් තරුණ සංවිධාන උපරිම ප්‍රයෝජන ගනු ඇතැයි රජය බලාපොරොත්තු වේ. වර්තමාන යෞවන පරපුරේ සිතුම් පැතුම්, ඔවුන් මුහුණ දෙන ගැටලු සහ ඔවුන්ගේ දක්ෂතාවයන් ප්‍රයෝජනයට ගත හැකි අන්දම පිළිබඳව, මෙම සමුළුවේ දී සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.

**යොවුන් සවිය වෙබ් අඩවියෙන්**

විදේශ ගත වූ ශ්‍රී ලාංකික යොවුන් පරපුර වෙතටයි

- නම, ලිපිනය, වයස සහ ස්ත්‍රී/පුරුෂ භාවය
- ඔබගේ පුරවැසි භාවය
- දක්ෂ අන්දමින් සිංහල කතා කිරීමේ සහ ලිවීමේ හැකියාව
- ශ්‍රී ලංකාවේ සිරිත් විරිත් සහ ඒවා තරුණ පරපුරට බලපාන අන්දම පිළිබඳව අවබෝධය
- ඔබ ජීවත්වන රටේ තරුණ කටයුතු සහ ගැටලු පිළිබඳව දක්වා ඇති උනන්දුව
- තරුණ කටයුතු පිළිබඳව ලබා ඇති විශේෂ පුහුණුවක් සහ අධ්‍යයනය

ඉහත කරුණු පිළිබඳ විස්තර අපට සපයන්න. විදේශ රටවල වෙසෙන ශ්‍රී ලාංකික සම්භවයක් ඇති යෞවනයන් (ගැහැණු/පිරිමි) 100 දෙනෙකුට, 2014 දී, ශ්‍රී ලංකාවේ පැවැත්වෙන මෙම සමුළුවට සහභාගී වීම සඳහා අවස්ථාවක් ලබා දීමට රජය බලාපොරොත්තුවේ. සතියකට සියලු පහසුකම් රජයෙන් සපයනු ලැබේ. ඔබගේ වාසනාව උරගා බලන්න.

QUESTION

Having read the news item above, write an email application to send to the conference organisers. Provide all the information requested and other relevant details to persuade the conference organisers that you would be a very suitable participant in 2014.

ඉහත ප්‍රවෘත්තිය කියවා, අසා ඇති සියලු විස්තර සහ අදාළ කරුණු ද සපයමින්, 2014 සමුළුවේ සහභාගිත්වයට ඔබ ඉතා සුදුස්සකු ලෙස සමුළුවේ සංවිධායකයන් පෙළඹවීමට, ඔවුන් වෙත විද්‍යුත් තැපෑලෙන් යැවීම සඳහා ඉල්ලුම් පතක් ලියන්න.

*Do not remove this page from the question booklet.*

| Student/Registration Number | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

| Centre Number | | | | | | |
|---|---|---|---|---|---|---|

Sinhala
Continuers Level

Question 9



PLEASE TURN OVER

**End of Section 2**

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | |

**2013 PUBLIC EXAMINATION**

# Sinhala

## Continuers Level

### Section 3: Writing in Sinhala (20 marks)

**Instructions to Students**

1. Allow approximately 40 minutes for Section 3.
2. Write your answer to a question from Section 3 in this booklet in black or blue pen. Space is provided for you to make notes.
3. You must answer ONE question in SINHALA.
4. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
5. All question booklets will be collected at the end of the examination.

© *Victorian Curriculum and Assessment Authority 2013*

**Section 3** (Questions 10–13)
(20 marks)

---

*When judging performance in this section, the examiner(s) will take into account the extent to which the student demonstrates:*

- *relevance and depth of treatment of ideas, information, or opinions;*
- *accuracy and range of vocabulary and sentence structures;*
- *the capacity to structure and sequence response and capacity to use conventions of the text type.*

---

Answer ONE question from this section in approximately 250 words in SINHALA.

10. Write an evaluative article for an educational magazine about the extent to which technology plays a positive or negative role in education today.

    තාක්ෂණයේ භූමිකාව අද අධ්‍යාපනය සඳහා කෙතරම් දුරට වාසිදායක හෝ අවාසිදායක වේ දැයි, ඇගයමින් අධ්‍යාපන සඟරාවකට ලිපියක් ලියන්න.

11. Write a formal letter to the Minister of Transport in your state to present your personal views about public transport. In your letter, include the benefits of improving public transport.

    පොදු ප්‍රවාහනය පිළිබඳව, ඔබේ පෞද්ගලික අදහස් දක්වමින් ඔබේ ප්‍රාන්තයේ ගමනාගමන ඇමති තුමාට විධිමත් ලිපියක් ලියන්න. එම ලිපියෙහි පොදු ප්‍රවාහනය දියුණු කිරීමෙන් ඇති වන වාසි ද ඇතුලත් කරන්න.

12. You are a member of a youth organisation that works to achieve a greener environment. Write an informative report for your local newspaper about important activities of the organisation. The title of your report will be, ‘Action is more impressive than advice’.

    වඩා හරිත පරිසරයක් ඇති කිරීම සඳහා ක්‍රියාත්මකවන තරුණ සංවිධානයක ඔබ සාමාජිකයෙකි. එයින් සිදුකරන වැදගත් ක්‍රියාකාරකම් පිළිබඳව විස්තරාත්මක වාර්තාවක්, ‘අවවාදයට වඩා ක්‍රියාව උතුම්ය’ මාතෘකාව යටතේ ප්‍රාදේශීය පුවත් පතකට ලියන්න.

13. Write an imaginative short story about the time you met King Kashapa when you visited Sigiriya. Your story will be published in the short-story section of a newspaper published for the Sinhala-speaking community in Australia.

    ඔබ සීගිරිය නැරඹීමට ගිය විටදී කාශ්‍යප රජු මුණ ගැසුණු අවස්ථාවක් පිළිබඳව මනඃකල්පිත කෙටි කතාවක් ලියන්න. ඔබේ කතාව ඕස්ට්‍රේලියාවේ සිංහල කතා කරන සමාජය වෙනුවෙන් මුද්‍රණය වන පුවත් පතක කෙටි කතා කොටසේ පළවේ.

You may make notes in this space.

Question Number:

**End of Section 3**